| | |
|---|---|
| සියලුම හිමිකම් ඇවිරිණි<br>All rights reserved | # මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2017<br>## Primary Piriven Mid Term Test - 2017<br>3 වසර / Grade 3<br>සිංහල / Sinhala — කාලය : පැය තුනයි / Time : Three hours |

◊ **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 200කට නො අඩු රචනයක් ලියන්න.

(I) කියවීම දැනුම පෝෂණය කරයි.

(II) ඩෙංගු උවදුර පිටු දකිමු.

(III) මත් රකුසාගෙන් වැළකෙමු.

(IV) ස්වාභාවික ආපදාවලින් ආරක්ෂා වෙමු.

(V) පන්සිල් සුරකින සමාජයක වටිනාකම.

(ලකුණු 25යි)

02. (අ) ඌෂ්මාක්ෂර ලියා දක්වන්න. (ලකුණු 5යි)

(ආ) මහාප්‍රාණාක්ෂර ලියන්න. (ලකුණු 5යි)

(ඇ) අන්තඃස්ථාක්ෂර ලියා දක්වන්න. (ලකුණු 5යි)

03. (අ) පහත දැක්වෙන වචනවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

(I) උකුස්සා

(II) මොනරා

(III) අශ්වයා

(IV) ඇතා

(V) සිංහයා

(ලකුණු 5යි)

(ආ) හිස්තැනට ගැළපෙන අකුර වරහන් තුළින් තෝරා ලියන්න.

(I) ............න්ගතු බව (ලෙ / ළෙ)

(II) ය..........ර්ථය (තා / ථා)

(III) ..........ර්යාව (බා / භා)

(IV) ලේ.........නය (ඛ / ක)

(ලකුණු 5යි)

(ඇ) පහත සඳහන් එක් පදයක් සඳහා එක් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

(I) ගොවියා

(II) බමුණා

(III) ගුරුතුමා

(IV) සඟරුවන

(V) මිනිසා

(ලකුණු 5යි)

04. (අ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කරන්න.

(I) දකුණු + අත

(II) පුද + අසුන

(III) මහ + ඉසුරු

(IV) ගඟ + වතුර

(V) පින් + ඇති

(ලකුණු 5යි)

(ආ) පහත සඳහන් සමාස පද කවර සමාස වර්ගයට අයත් දැයි නම් කරන්න.

(I) ගල්හිත

(II) පාසිවුරු

(III) සුපුන්

(IV) රන්කොත

(V) පසැස්

(ලකුණු 5යි)

(ඇ) පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවා ලියන්න

(I) මම දිනපතා තෙරුවන් නමදිමි.

(II) ලේඛකයා පොතක් ලියන්නේ ය.

(III) තෝ කොහි යහි ද?

(IV) නුඹ මට එරෙහි වූයෙහි ද?

(V) භික්ෂුව ධර්මය දේශනා කළේ ය.

(ලකුණු 5යි)

05. (අ) අකාරන්ත ස්ත්‍රී ලිංග ''නළඟන'' ශබ්දය සියලු විභක්තිවල ඒකවචන සහ බහුවචනයෙහි වරනගන්න. (ලකුණු 10යි)

(ආ) විධි ක්‍රියාව උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 5යි)

06. උම්මග්ග ජාතක කතුවරයා බෝසතුන්ගේ ප්‍රඥා මහිමය දැක්වීම සඳහා යොදාගත් අවස්ථා කීපයක් මතුකර දක්වන්න.

(ලකුණු 15යි)

07. බුදුගුණ අලංකාරයේ ඔබ කැමති කවි තුනක් ලියා එහි අර්ථය ලියන්න.

(ලකුණු 15යි)

08. ''මිනිසුන් සමාජ ජීවිතයට හුරු කරවීමට උපදේශ සපයන කෘතියකි, වනකථා'' මෙය, උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)